


වර්තමාන සිංහල සමාජය තුළ ගීතය ජනප්‍රිය සාහිත්‍යාංගයකි. එසේ වුවද හුදෙක් ගීතයක් ලෙස පද මාලාවක් රචනා කොට, හිතුමතේට ඊට සංගීතය ද යොදාගනිමින්, යන්තමින් ගීයක් ගයන්නට ශක්තියක් ඇති සගයකු හෝ වෙනත් කෙනකු ලවා එය ගායනා කරවමින් ගීත සාහිත්‍යයට එක් වන්නට තැත් කරන ඇතැම් අය, ගීතයේ උසස් කලාත්මක ගුණයට හානිකර තත්වයක් උදා කරවන්නට යොමු වී තිබීම සිංහල ගීත සාහිත්‍යය සම්බන්ධයෙන් පවත්නා අසතුටුදායක ප්‍රවණතාවකි. සැබෑ ගීතය යනු කුමක්දැයි එවන් ආධුනික ගීත රචකයන්ට හා රචකයා සැබවින්ම කැපී පෙනෙනු ඇත. තමන් වෙත හදිසියේම එන තම සගයකු ගීතයක් ලියා දෙන්නැයි කරන ඉල්ලීමට ඔහු පිටු පෑවේ කලාතුරකිනි. එපමණක් නොව, ඇතැම් විටකදී, ඒ මොහොතේම, තම අතෙහි වූ කුඩා කොළ කැබැල්ලක් ශ්‍රී ලංකා ගු-ඃවන්විදුලි සංස්ථාවේ කොරිඩෝරයක බිත්තිය මත තබා ගීතයක් රචනා කර දුන් අවස්ථා ගැන ද අසන්නට ලැබෙයි. ගී පද රචනයෙහිලා ප්‍රේමකීර්ති තුළ තිබූ අසාමාන්‍ය ප්‍රතිභාව ඔහු අතින් ලියවුණ ගීත සමූහයෙන් මැනවින් ප්‍රකට වෙයි.

තරංගය හේතු කොට ගෙන ඇති වන්නක් බව නිසැකය.

උපන් දින සාදවලදී, ඒවා දරු-වන් වෙනුවෙන් හෝ වැඩිහිටියකුගේ උපන් දිනයක් වෙනුවෙන් හෝ පැවැත්වුවද විශාල මුදල් සම්භාරයක් වැය කරමින්, මස්මාංශවලින් පිරුණු භෝජන සංග්‍රහයක් ලෙසින් ඒවා සිදු කිරීමටත් බො-හෝ විට එවන් අවස්ථාවලදී එක් රොක් වන වැඩිහිටියන් මත්පැනින් සප්පායම් වෙමින් ඉවක් බවක් නොමැතිව හැසිරීමටත් යොමු වන අවස්ථා විරල නොවේ. මෙබඳු අවස්ථා අද සමාජය තුළ ශීඝ්‍රයෙන් පැතිර යමින් ඇති නමැති මල් රැගෙන අපි පන්සල් යමු" යි ඔහු දියණියට යෝජනා කරයි. දරුවන් වූ කලී මල් හා සමාන බව අප නිතර කියන කියමනකි. එම අරුත ද සම්බන්ධ කරගන්නා ගී පද රචකයා පියකු තම දියණිය වෙත ගෙන එන මේ සුන්දර පණිවුඩය එක් දියණියකට නොව, ඇය වැනි බො-හෝ දරුවනට අදාළ වෙයි.

# 'පරපණ නසනා දිනයක් නොකරන් දියණියෙ නුඹගේ උපන් දිනේ'

ගායක ගායිකාවන්ට කියා දෙන්නට කිසිවකු යොමු වී නොතිබීම ද ඇත්ත වශයෙන්ම කනගාටුවට කරුණකි.

ගී පද රචනය සඳහා රචකයකු සතුව අපූර්ව ප්‍රතිභාවක්, කවිත්වයක් මෙන්ම භාෂාව හා සංගීතය පිළිබඳ නොමඳ දැනුමක් ද තිබිය යුතුය. වර්තමාන සිංහල ගීත සාහිත්‍යය තුළ සුභාවිත ගීතය පසෙකට තල්ලු කර දමමින් මෙවන් දුර්වල ගීත ඉදිරියට එන්නට කොතරම් වෙර දැරුවත් එය තාවකාලික තත්වයක් පමණක් වනු ඇතැයි යන්න සැබෑ දක්ෂතා ඇති ගීත රචකයන්ගේ පරම අභිලාෂය බව අමුතුවෙන් නොකිවමනාය. වර්තමානයේ, විශේෂයෙන්ම විවිධ එෆ්. එම්. නාලිකා ඔස්සේ අපට අසන්නට ලැබෙන බොහෝ ගීත හුදෙක් එක් කලකට පමණක් ගැළපෙන හා එම කාල සීමාව තුළදී ඇති වී නැති වී යන ගීත බවට පත් වීම නිරායාසයෙන්ම සිදුවන්නකි.

මෙම තත්වය අනුව සලකා බලන විට අප අතර විසූ එමෙන්ම තවදුරටත් අප අතර සිටිමින් සැබෑ ප්‍රතිභාන්විත ගීත රචනා කළ කලා කරු-වන්ගේ ගීත අතලොස්සක් වුවද ඒවායේ ගුණාත්මක බව, කලාත්මක බව සර්වකාලීනව ඇගයීමට ලක් වීම නියත වශයෙන්ම සිදු වන්නකි. විශිෂ්ට ගීතයක් ලෙස සැලකිය හැකි නිර්මාණයක පද රචනය, සංගීතය මෙන්ම ගායනය ද විෂයයෙහි එම විශිෂ්ටත්වය දක්නට ඇත. එයිනුදු, පද රචනය දෙස අවධානය යොමු කරන කල්හි, වටිනා, ගුණාත්මක බවෙන් යුක්ත පද රචනයකට හොඳ සංගීත නිර්මා-ණයක් සමග මිහිරි ගායනයක් ද මැනවින් පෑහෙනු ඇත.



විශේෂයෙන්ම ගීතවල පද රචනය කෙරෙහි අවධානය යොමු කරමින් කෙරෙන අධ්‍යයනයකදී විවිධ අංශ සැලකිල්ලට ගත යුතු වෙයි. එක් අතකින් බලන විට කවර සාහිත්‍ය නිර්මාණයකින් වුවද සහෘදයාට උසස් රසයක් දැනවිය යුතු වෙයි. පද මාලාවෙහි දක්නට ලැබෙන අර්ථවත් බව එම රස වින්දනයේදී අත්‍යවශ්‍ය වනු ඇත. ගීතයක අන්තර්ගත පද සමූහය මගින් එහි නිර්මාණ කරුවා රසිකයා වෙත ගෙන එන වැදගත් පණිවුඩයක් ද අපේ-ක්ෂා කළ හැකිය. සාහිත්‍යය යනු රසවත් වැකියක් නැතහොත් රස දනවන නිර්මාණයක්ය යන මූලික සංකල්පය සිත්හි දරාගෙන ගීතයක පද රචනය කෙරෙහි අවධානය යොමු කරන රසිකයා ඒ සමගම එම පද සංයෝජනයෙන් අවසානයේදී සමාජය වෙත ගෙන එන අර්ථවත් අදහසක් ද අපේක්ෂා කරයි. කවර අන්දමේ තේමාවක් පාදක කරගනිමින් හෝ ගෙතෙන ගී පදවැලකින් අප වෙත ගෙන එන අර්ථවත් පණිවුඩය ගීයෙහි රස විඳගන්නා අතරම අප සිත් තුළ ධාරණය වනු ඇත.

සිංහල ගීත සාහිත්‍යය දෙස පුළුල් විමර්ශන ඇසකින් බලන කවර පාඨකයකුට වුවද මතකයට නංවාගත හැකි විශේෂ නම් කිහිපයක් වෙයි. ඒ අතුරෙන් ප්‍රේමකීර්ති ද අල්විස් නම් වූ අපූර්ව ප්‍රතිභාවක් හිමි කරගෙන සිටි සිංහල ගීත සාහිත්‍යයේ දිදුලන තරුවක් ලෙස අදත් සිහිපත් කරගත හැකි ගී පද ගීතයක පද නිර්මාණයේදී බොහෝ විට සමාජය දෙස බලා විවේචනාත්මක, විමර්ශනශීලී, එමතු නොව වක් මගින් දෙන යහපත් පණිවුඩයක් අන්තර්ගත වන සේ ගීත රචනයට අපූරු දක්ෂතාවක් හිමිව සිටි ප්‍රේමකීර්ති ද අල්විස් අතින් ලියවුණ රසවත් මෙන්ම, ගැඹුරු අරුත් දනවන සුන්දර ගීත අතරට ගැනෙන ගී රාශියක් වෙයි.



සම්මානිත මහාචාර්ය
කුසුමා කරුණාරත්න

වර්තමාන සමාජය තුළ පවත්නා තරඟකාරී වාතාවරණය පවුල් ඒකකයට කොතරම් තදින් දැනී ඇද්ද යන්න අද ලියවෙන බොහෝ ගීත, පද්‍ය මෙන්ම අනිකුත් කලා නිර්මාණවලින් ද ප්‍රකට වෙයි. දරුවන්ගේ ජන්ම දින සැමරීම අතිශය උත්සවාකාරයෙන් පැවැත්වීමට දෙමාපියන් යොමු වන්නේ කරුණු කිහිපයක්ම පාදක කරගෙන විය හැකිය. එක් අතකින් බලන විට තම දරුවාට ඇති අසීමිත ආදරය හා සෙනෙහස පෙරදැරි කරගෙන දරුවා වෙනුවෙන් උත්කර්ෂවත් ලෙස උපන් දින සාද පවත්වන්නට දෙමාපියන් යොමු වනු ඇත. ඒ හැරුණ විට සෙසු අයගේ දරුවන් වෙනුවෙන් පැවැත්වෙන එවන් සාදවලට ඉහළින් සිටින සේ තම දරුවාගේ උපන් දින සැමරුම සිදු කරන්නට ද ඔවුන් සිතනවා විය හැකිය. මෙය සැබවින්ම අද සමාජය තුළ පිළිලයක් වී පවතින බව දැකීමෙන් තමන් තුළ ඇති වූ සංවේගය රසවත් මෙන්ම අර්ථවත් වූ ද ගීතයක් ලෙස එළිදක්වන්නට ප්‍රේමකීර්ති යොමු වූ අවස්ථාවක් අපගේ මතකයට නැගෙයි.

"පරපණ නසනා දිනයක් නොකරන්
දියණියෙ නුඹගේ උපන් දිනේ
අපි යමු පන්සල් ගෙන නුඹ වැනි මල්
සුපිපුණු පැල්පත් මිදුල කොණේ . . . . . ."

ආදරණීය පියෙකු තම දයාබර දියණියට දෙන යහපත් මෙන්ම සුන්දර වූ ද පණිවුඩයක් ලෙසින් මෙම ගී පද පෙළගැස්වී ඇති ආක-ාරය සැබවින්ම සිත්ගන්නා සුලුය. තම දියණියගේ උපන් දිනය වෙනුවෙන් ඉහළම මට්ටමේ භෝජන සංග්‍රහයක් පිළියෙල කරන්නේ නම් ඒ වෙනුවෙන් මිය යන සතුන් කොතෙකුත් ඇති බව පියා තම දියණියට මතක් කර දෙයි. "ඔබගේ සුන්දර උපන් දිනය සතුන් මරන දිනයක් කරනු වෙනුවට, ඔබ වැනි සුන්දර මල් රැගෙන, එනම් ඔබ හා සමාන සෙසු සුන්දර, අහිංසක දරු පිරිසක් "අපි යමු පන්සල් . ගෙන නුඹ වැනි මල් . සුපිපුණු පැල්පත් මිදුල කොණේ" යන පද යෝජනයෙන් ද ගීත රචකයා සමාජය වෙත දයානුකම්පාවකින් යුතුව සිතන, බලන ආකාරය පෙන්වයි. ධනවතුන්ගේ නිවෙස්වල දරුවන් වෙනුවෙන් පැවැත්වෙන භෝජන සංග්‍රහයන් පර පණ නැසීමක් ද මුල් කරගෙන සිදු වෙයි. එවැනි පාපකාරී දේ කරනු වෙනුවට පැල්පත්වල වෙසෙන අහිංසක, සුන්දර දරුවන් කෙරෙහි ද මෙත්සිත් වඩවමින් ඔවුන් ද එක් කරගෙන පන්සල් යාමෙන් උපන් දිනය සැමරීමේ අගනා කර්තව්‍යය ගී පද රචකයා මෙහිදී ඉස්මතු කර දක්වන්නේ සහෘද සිත් තුළ ද එම යහපත් පණිවුඩය සනිටුහන් කරමිනි.

මෙවන් සමාජ ක්‍රියා පිළිබඳව තව දුරටත් හෙළි කරමින් මෙම නිර්මාණ කරුවා,

"සඳලුතලාවල අත්තල ගසමින් සුරාමතින් රඟනා
උන්නේ
සාද නොගත්තෙමි නුඹ ඉපදුණ දා මව්පියො
උන්නේ කුස ගින්නේ"

සමාජය තුළ පවත්නා විෂමතාව කෙරෙහි ද රසික අවධානය යොමු කරවන්නට ප්‍රේමකීර්ති ගෙන ඇති උත්සාහය උක්ත පද පෙළ දෙස බලන විට ප්‍රත්‍යක්ෂ වෙයි. වත්මන් සමාජයේ ඇතමුන් මෙවන් අවස්ථා සමරන මුවාවෙන් තම ආශාවන් ඉටු කර ගනිමින් හිස් ජීවිත ගෙවද්දී අහිංසක දුප්පත් දෙමාපියන් තම දරුවන් බිහි කරන අවස්ථාවලදී පවා කුසට අහරක් හෝ නොගෙන